(6)
00262

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2018/2019

**ESD2236/EPD4536-** සමාජ මනෝවිද්‍යාව

කාලය - පැය තුන (03) යි.

---

දිනය - 2020.10.03 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියලු ප්‍රශ්නවලටත් 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකටත් (03) පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. 'සමාජ මනෝ විද්‍යාව' යන පදය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ඒත්තු ගැන්වීම හෙවත් ප්‍රරෝචනය යන්නෙහි ප්‍රධාන අංග හතර (04) නම් කරන්න.

03. 'සමාජ ස්වියත්වය' යනු කුමක්දැයි උදාහරණයක් දෙමින් ඔබේ වචනයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ප්‍රාථමික පාසල් ළමුන් අතර ධනාත්මක ආකල්ප සංවර්ධනය කිරීමට උපකාරී වන ක්‍රියාකාරකම් හතරක් (04) ලැයිස්තු ගත කරන්න.

05. ළමුන්ගේ ආක්‍රමණශීලී හැසිරීම අවම කිරීම සඳහා යොදා ගත හැකි උපාය මාර්ග හතරක් (04) සඳහන් කරන්න.

06. 'ස්ත්‍රී පුරුෂභාවය 'සහ 'ලිංගිකත්වය' අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

07. 'වෙනස්කම් කිරීම' පදය කෙටියෙන් විස්තර කරන්න.

08. පෙර පාසල් දරුවන් තුළ සමාජයට අනුගත හැසිරීම් හතරක් (04) ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) උදාහරණ දක්වමින් 'හිතකර සමාජ චර්යා' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) හිතකර සමාජ චර්යා ඇතිවීම කෙරෙහි බලපාන සාධක කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ඉහත සාධක කුඩා ළමයින්ගේ හිතකර සමාජ චර්යා සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය විමර්ශණය කල යුතුය.) (ලකුණු 06)

(iii) ප්‍රාථමික පාසල් ළමයින්ගේ හිතකර සමාජ චර්යා සංවර්ධනය සඳහා වන ගුරු භූමිකාව විමර්ශණය කරන්න. (ලකුණු 08)

10. (i) 'ආකල්ප' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 06)

(ii) 'ආකල්ප' හා 'හැසිරීම්' අතර ඇති සම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඔබ ඉගෙන ගත් ආකල්ප හා සම්බන්ධ න්‍යායක් මත පදනම් ව, ප්‍රාථමික ළමයින් තුල ඍණාත්මක ආකල්ප නිවැරදි කිරීම සඳහා වන ක්‍රියාවලියේ දී ගුරුවරයකු ලෙස මුහුණ පෑ හැකි ගැටළු (අවම වශයෙන් හතරක්) සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. (i) උදාහරණ දක්වමින් ප්‍රාථමික පාසල් අවධිය තුළ ළමුන් ඔවුන්ගේ සමාජ සම්බන්ධතා වර්ධනය කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ප්‍රාථමික පාසල් කාලය තුළ ළමයින්ගේ ස්වයං සංවර්ධනය සඳහා ගුරුවරයා විසින් යොදා ගත හැකි උපක්‍රම හයක් **(06)** සඳහන් කරන්න. (ලකුණු 06)

(iii) ඔබ ඉහත සඳහන් කළ ඕනෑම උපක්‍රම දෙකක් **(02)** තෝරාගෙන ළමයින්ගේ ස්වයං සංවර්ධනය සඳහා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) ප්‍රාථමික පාසල් ළමුන් අතර ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමට උපකාරීවන ක්‍රියාකාරකම් පහක් **(05)** ලැයිස්තු ගත කරන්න.
(ලකුණු 06)

(ii) ඔබ ඉහත සඳහන් කළ ක්‍රියාකාරකම් අතුරින් තුනක් **(03)** තෝරාගෙන උචිත උදාහරණ සපයමින් ඒවා විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කළ **එක් (01)** ක්‍රියාකාරකමක් තෝරා ඔබේ ප්‍රදේශයේ ප්‍රාථමික පාසල් සඳහා ක්‍රියාත්මක කිරීමට සුදුසු සැලැස්මක් යෝජනා කරන්න.
(ලකුණු 08)

13. (i) ආක්‍රමණශීලී චර්යා පිළිබඳව සමාජ ඉගෙනුම් න්‍යාය තුළින් ඉදිරිපත් කර ඇති අදහස් උදාහරණ දක්වමින් විමර්ශණය කරන්න. (ලකුණු 06)

(ii) ප්‍රාථමික පාසල් ළමුන් අතර දැකිය හැකි සුලභ ආක්‍රමණශීලී හැසිරීම් හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 06)

(iii) ඔබ ඉහත සඳහන් කර ඇති ඕනෑම ආක්‍රමණශීලී චර්යා තුනක් **(03)** අවම කිරීම සඳහා යොදා ගත හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් තුනක් **(03)** විස්තර කරන්න. (ලකුණු 08)

\- හිමිකම් ඇවිරිණි. -